# අපචාර අපරාධ හා මාධ්‍ය කලාව

දැන් අප මව් රටේ යුද්ධයක් නැත. යුද්ධයක් සිදුවී ඇති බව කතාකරන්නට ඉතිරි කර යුද්ධය අවසන් වී ඇත. වසර තිහක යුද්ධය පුරාවට අප රටට පමණක් නොව ලෝකය පුරා ව්‍යාප්ත වී ඇති මාධ්‍ය ලෝකයට අප රට ගැන කථා කරන්නට ඕනෑ තරම් පුවත් තිබිණි. ඒ වසර තිහ පුරාවට අප රටේ මාධ්‍ය කලාව ජනතාව සමඟ බද්ධ වී සිටියේ යුද්ධය සමඟය. එකලද අද වැනිම අපරාධ මුළු රට පුරාම සිදුවිය. එහෙත් යුද්ධයේ කඩතුරාවෙන් එය වැසී ගියේය. අද ලෝකයේ සංවර මාඹශ කලාවත් නැත එය අද අශීලාචාර වී ඇත. අසංවර මාධ්‍ය කලාව තුළින් කෙරෙන්නේ වැඩියෙන්ම අලෙවි කරගත හැකි පුවත ජනතාව අතර විකිණීමය. එදා දැරියක් දූෂණය කිරීම, කුඩා දරුවෙකුගේ අතපය කපා දමා මරා දැමීම පුවත් පතක මැද පිටුවකට සීමා වූ සුළු පුවතක් විය. බෝම්බයකට අසුවී හතළිහක් පනහක් මියයාම ලොකු පුවතක් විය. ඇත්තෙන්ම එය කුකුළා හා




හරකා වැනිය. කුකුළෙක් මරනවාට වඩා හරකෙක් මැරීම තුළින් බොහෝ පාපයන් පිරෙන්නාක් වැනිය. මිනී පෙට්ටි සාප්පු කාරයෙකු බොහෝ සෙයින් කැමති වැඩියෙන් මිනිසුන් මැරෙනවා දකින්නටය. එම ශෝකය දුක තුළින් ඔහුගේ මඩිය තරවෙන බව ඔහු දන්නේය. එලෙසම අප රටේ ව්‍යාපාරික මාධ්‍යකරුවන් යටි සිතෙන් හෝ ප්‍රභාකරන්ට ආදරය කරන්නට ඇත. එසේම ප්‍රභාකරන් වැනි පුද්ගලයෙකු බිහි වූ මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමයටද ආදරය කරන්නට ඇතිය. අද ලොවේ ඇති ප්‍රධානතම මාධ්‍යය වෙළඳාම යුද්ධය හා බද්ධව ඇත. එයින් ඔවුන් පාඩු ලබන්නේ නැත. පාඩුව සිදුවන්නේ යුද්ධයෙන් මියයන්නාටය. ඔවුන්ගෙන් ජීවත්වූවන්ටය.

අද ලෝකයේ සේම අප රටේ මාධ්‍යකරුවන්ට ජීවත්වීමට පුවත් අවශ්‍ය වේ. එහෙත් ඔවුන් හඹා යන්නේ වැඩියෙන්ම විකිණෙන පුවතය. අප රටේ ජනතාව කුණු රසයට ලොල් බව ඔවුන් දනී. පුවත් පතකින් සාහිත්‍ය අතිරේකයට පිටු භාගයක් වෙන්කර පිටු හත අටක් කුණු රසයෙන් පිරී බංකොලොත් වූ පුවත්වලට වෙන්කිරීමට තරම් අප රටේ පුවත් පත් අසරණ අගාධයකට වැටී ඇත. අද බොහෝ දෙනා සිළුමිණ, දිවයින, ලංකාදීප, ලක්බිම ආදී ප්‍රසිද්ධ පුවත් පත් මිලට ගන්නේ වැඩියෙන්ම ලොකු අකුරුවලින් වැටී ඇති මුල් පිටුවේ පුවත බලාය. මුල් පිටුවේ ඇත්තේ කුණු රසයෙන් පිරී පුවත් කෑලිය. ඉතුරු ටික බැලීමට ඇතුල් පිටුවලට යා යුතුය. රූපවාහිනියද එසේමය. ළමා මනසට ගෝචර උසස් වින්දනයක් ඇති වැඩසටහන් හිඟය. බාගෙට ඇඳුම් ඇන්ද වූ වැඩිහිටි ගී ගයන දරුවන්ගේ ස්ටාර් තරඟ පිරී ඇත. ඒවා නරඹන වැඩිහිටියෝ දරුවන්ද වැඩිහිටියන් බවට පත්කරති. රටකට ගෝචර උචිත එම රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක කරගත හැකි සන්සුන් මසකින් බුද්ධිමත්ව ලොව දෙස බැලිය හැකි දරුවන් වෙනුවට ඔවුන් බිහි කරන්නේ අමුතුම තාලයක රොබෝවරුන්ය.

ගුණාත්මක මාධ්‍ය කලාව වලපල්ලට වැටී අසංවර ජඩ මාධ්‍ය කලාවක් අප රට තුළ හිස ඔසවා ඇත. පුවත් පත් මුදලාලිලා විසින් කවිය, කෙටි කතාව ආදී සාහිත්‍යයන් කපා දමා ඇත්තේ පාඨකයා එයට අකමැති බව ප්‍රකාශ කරමිනි. පී. බී. සේනානායක,

මහගම සේකරයන් ගැන නොදන්නා මාධ්‍යකරුවන් අප අතර සිටිනවා යැයි මා පැවසුවහොත් ඔබ පුදුම වනවා නොඅනුමානය. නමුත් සත්‍ය එයයි. මාර්ටින් වික්‍රමසිංහ, පී. බී. සේනානායක, කේ. ජයතිලක වැනි ශ්‍රේෂ්ඨ සාහිත්‍යකරුවන් ආධුනිකයන් ලෙස මුලින්ම ලිව්වේ පුවත්පත් වලටය. එදා පුවත්පත සාහිත්‍යධරයන් බිහිකළේ එලෙසය. විවෘත ආර්ථික රටාව තුළ සාහිත්‍යයට ඉඩක් නැත. මේ ගෝලීය කරණ විවෘත ආර්ථික රටාව තුළින් මුදලට ඇති ඉල්ලුම හා ලැදියාව ඉහළ දමා මිනිස් ජීවිත හෑල්ලු කර ඇත.

අප කුඩා කළද ළමා අපචාර සිදුවූයේ ය. ඒවා ගෙවල් තුළම, දෙමව්පියන්ගේ හදවත් තුළ සැඟව ගියේ ලෝකයට වසන් කරමිනි. අද මෙන්ම එදත් ළමා අපචාරවලට සම්බන්ධ දේශපාලඥයන් සිටියේය. එහෙත් සභ්‍යත්වය නැමති කඩතුරාවෙන් ඒ සියල්ල වැසී ගියේය. කුඩා ළමුන් සමලිංගික සේවනයට යොදාගන්නා බලවතුන් අද මෙන්ම එදත් සිටි බව කවුරුත් දන්නා කරුණකි. ඔවුන් හැඳින්වූයේ කොටියෝ කියාය. එදා ගමේ සිටි ළමා අපචාර වලත්තයින් ප්‍රසිද්ධවම අපචාර කටයුතු කරගෙන ගියේ නඩුහබ කිසිවක් නැතිවය.

මා ඔබට මේ ලිපියෙන් පවසන්නේ ප්‍රාදේශීය වාර්තාකරුවෙකු විසින් පුවත්පතකට ලියූ අනතුරක් සම්බන්ධවයි. අනතුරක් වුවද එය අපරාධයකි. මියගිය පුද්ගලයා මගේ ඥාතියෙකි. ඔහු ඔහුගේ හොඳම අතිජාත මිතුරා සමඟ මලගෙදරකට ගියේ ඔහුගේම මෝටර් බයිසිකලයෙනි. එහෙත් කඩුවෙලදී ඔවුන් දෙදෙනා යටකර තලා දැමූ වෑන් රථය පලා ගියේ අවට සිටි අයද විමතියට පත්කරමිනි.

මිතුරාගේ හිස තැලී එතැනම මියගිය අතර මාගේ ඥාතියා මිය ගියේ පැයක් පමණ පාරේ වැටී සිට අවසානයේ ලංගම බස් රථයක පටවා රෝහලට ගෙනයන අතරතුරදීය. ඔහු තරුණය. ඔහුට කිසිම ප්‍රේම සම්බන්ධතාවක්ද තිබුණේ නැත. එහෙත් වාර්තාකරුවා එය පුවත්පතට ලිව්වේ ළඟදීම මංගල සීනු හැඩවීමට සිටි ලලිත් ඇය තනිකර දමා යයි කියාය. එලෙසම ඔහු අනෙක් වැකිය ලිව්වේ පස මිතුරෙකු සමඟ මෝටර් සයිකලයේ ගමන් ගත් බවය. පුවත රසවත් කිරීමට ඔහු අළුතින් පුවතක් මැව්වේය. සාරවත් මනසකින් පිරි ජනතාවක් බිහිකරනවා වෙනුවට ඔවුන් අද සමාජයට ලබාදෙන්නේ ජනතාව ඉල්ලන දේය. දේශපාලනයෙන් ගන්ධද්සාර වී ඇති රටකට අප්‍රබංස වූ මාධ්‍යකරණයනින් ඇති ඵලය කිම. "ඔබ නැතුව ඔබ එක්ක" වැනි සම්මානනීය චිත්‍රපටයක් "රන් කරඬුව" වැනි උසස් සාහිත්‍ය කෘතියක් ගැන කතිකාවතක් ගොඩනගනවා වෙනුවට, නුගේගොඩ පාලම යට ඇඳුම් ඉරාගෙන ගුටි කෙළගත් ටෙලි නිළියන්ගේ කුණු රසයෙන් පාඨකයා පිනවීමට තරම් අද අප රටේ මාධ්‍යය පහත් තත්ත්වයකට ඇද වැටී ඇති බව කියන්නට සිදුව ඇත්තේ කණගාටුවෙනි.

මෑතකදී අප රටේ මහත් ආන්දෝලනයක් ඇති කළ මාතෘකාවක් බවට පත්වූයේ කොටකදෙණියාවේ සේයා සදෙව්මිගේ දැරියගේ ඝාතනයයි. එම කුඩා දැරියට කළ තිරශ්චිත අපරාධය වෙනුවෙන් මුළු රටේම ජනතාව නැගී සිටියේ ටොයියන්ගේ සහ බයියන්ගේ මාධ්‍යය වාර්තාද පරදාය. එහිදී මාධ්‍යකරුවන් හැසිරුණේ කොණ්ඩයා නමැති ඒ අපරාධකරුටත් වඩා අන්ත විදිහටය. එහිදී මුලින්ම සැකයක සේයාව මුල් වූයේ පියාටය. මාධ්‍යකරුවන් තළුමරමින් සේයාගේ පියා මුලින්ම නොමරා මරා දැමූවේය. අහළ පහළ මිනිසුන්ගේ අසාගත් බේගල්වලින් පත්තර පිරෙව්වෝය. ඊළඟට ඔවුහු පොලිසියේ අසීලාචාරයන් හා ගමේ ළිඳ ළඟ සංගමයේ වාර්තාකරුවන් සමඟ එක්වී වසර 17 ක් වූ බදු යෞවනයේ පසුවන පාසල් සිසුවෙකුගේ අනාගතය විනාශකර දැමුවෝය. ඔහු මත්කුඩු බොන, ගංජාකාරයෙකු කළේය. අසැබි චිත්‍රපට නරඹන අසංවර තරුණයෙකු බවට මුළු රට පුරාම ප්‍රචාරය කළේය. අරක්කු බූලි ගණන් උදේ හවා බොන රටක කසිප්පු බෝතලයක් සමඟ අල්ලා ගත් බේබද්දෙකුට පහර දෙන්නාක් මෙන් ඔහු එම දරුවාට සහ අනෙක් පුද්ගලයාට පහර දෙන්නට ඇත. සේයාට කළ අපරාධය හා සමානම අපරාධයක් ඔවුන් එම දරුවටද අත් කළේය.

අද රටේ කොණ්ඩයන් වැනි පුද්ගලයන් බිහිවීමේ ප්‍රවනතාවට මාධ්‍යයද වගකිව යුත්තේ ඒ අන්දමටය. මෙම අපරාධයට කොණ්ඩයා අසු නොවුනානම් වැරදිකරුවන් වන්නේ එම දරුවා සහ වැඩිහිටියාය. පොලිසිටය එය කළ හැකිය. එල්ලුම් ගහ ක්‍රියාත්මකව තිබී ඔවුන් වැරදිකරුවන් වූවානම් එල්ලුම්ගස් යන්නේ කොණ්ඩයා නොව ඔවුන්ය. එල්ලුම් ගහ නැවත ක්‍රියාත්මක කිරීම පිළිබඳව




බුද්ධිමත් ජනතාව දෙවරක් සිතිය යුත්තේ ඒ නිසාය.

එහිදී අසරණයන්ගේ බෙල්ලටද තොණ්ඩුව පාත්වේ. එසේම කොණ්ඩයන් වැනි මානසික රෝගීන් බිහිවන්නේ ඇයි ? ඒ ගැනද අපි තවදුරටත් සිතිය යුතුය. ඔහුගේ පියාද අපරාධකරුවෙකි. නිසි අධ්‍යාපනයක් නොලද කොණ්ඩයා ද ඒ අගාධයටම වැටී ඇත. මාධ්‍ය වාර්තාවලින් එල්ලුම්ගස් වලින් මේ ප්‍රශ්නය විසඳිය හැකිද ? අද කොණ්ඩයා යන යන තැන ගල් මුල් රැගෙන ජනතාව යන්නේ ඔහු ගල් ගසා මරා දමන්නටය. උල තබා රජ කාලේ දඬුවම් දෙන්නය. කොණ්ඩයා කළ අපරාධය සුළු පටු එකක් නොවේ. එහෙත් කොණ්ඩයාටත් වඩා අපරාධ කර ඇති දේශපාලඥයින් පිටුපස ගල් මුල් රැගෙන යන ජනතාවක් අපට සිටීද ? නැත. ඔවුන්ට ඡන්දය දී පාර්ලිමේන්තුවට යැවීමට තරම් කෘත ගුණ දන්නා ජනතාව කොණ්ඩයා මරා දැමීමට සැරසේ. ස්ත්‍රී දූෂණය තරම්ම විනාශකාරී ක්‍රියාවක් වන පරිසරය දූෂණය... එය කරන්නේ කවුද ? සිදුවන්නේ කුමක්ද ? යන්න ජනතාවට වැඩක් නැත. කොණ්ඩයා වැනි ස්ත්‍රී දූෂණකයන් මරා දැමීමෙන් දූෂණය නතර වේද ? ඔහුට දඬුවම් කළ යුත්තේ මරා දැමීමෙන් නොවේ. ජීවත්කර විඳවන්නට දීමෙනි. මරණය දඬුවමක් නොවේ. මරණයෙන් පසු අපරාධකාරයා නිදහස් වේ. ඔවුන් ලබන දඬුවමක් නැත. මිනිසුන් ජීවිතය හානිකර ගන්නේ සියල්ලන්ගෙන් නිදහස්වන්නටය. අප සොයාබැලිය යුත්තේ කොණ්ඩයන් වැනි අමනයන් මෙලොවට බිහිවෙන්නේ ඇයිද කියාය. මෙලොවට ළපටියෙක් බිහිවන්නේ අපරාධකාරයෙකු ලෙස නොවේ. මාධ්‍යයට ඒ වෙනුවෙන් කළ හැකි දෑ බොහෝය. යහපත් සමාජයක් ගොඩනගනවා වෙනුවට අද දවසේ ඔවුන් කරන්නේ අලෙවිකරණය පසුපස යාම පමණි.




**අද රටේ කොණ්ඩයන් වැනි පුද්ගලයන් බිහිවීමේ ප්‍රවනතාවට මාධ්‍යයද වගකිව යුත්තේ ඒ අන්දමටය. මෙම අපරාධයට කොණ්ඩයා අසු නොවුනානම් වැරදිකරුවන් වන්නේ එම දරුවා සහ වැඩිහිටියාය. පොලිසිටය එය කළ හැකිය. එල්ලුම් ගහ ක්‍රියාත්මකව තිබී ඔවුන් වැරදිකරුවන් වූවානම් එල්ලුම්ගස් යන්නේ කොණ්ඩයා නොව ඔවුන්ය. එල්ලුම් ගහ නැවත ක්‍රියාත්මක කිරීම පිළිබඳව බුද්ධිමත් ජනතාව දෙවරක් සිතිය යුත්තේ ඒ නිසාය.**

**To let**

Mount Waverley , Granny Flat, one bedroom, living area and kitchen, Gas heating/ cooking and AC, Separate unit with all amenities. Close to secondary collage public transports.
Suits to a couple.$225 pw.

**Text: 0423304673**